ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

## අවසාන විභාගය - ජූලි 2014

## (59) කළමනාකරණ ගිණුම්කරණය හා ව්‍යාපාර මූල්‍ය
(Management Accounting and Business Finance)

---

## A කොටස

කළමනාකරණ ගිණුම්කරණය (ලකුණු 75)

**සමස්ථ විග්‍රහය**

**මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.**

(1) A කොටසින් කළමණාකරන ගිනුම්කරණය ආවරනය වන අතර ඒ සඳහා ලකුනු 75 ක් වෙන් කර ඇත.

(2) B කොටස මගින් ව්‍යාපාර මුල්‍ය ආවරණය වන අතර ඒ සඳහා ලකුනු 25 ක් වෙන් කර ඇත.

**පොදු මතය**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂකයින්ගේ පිළිතුරු සැපයීම ගැන සෑහීමකට පත්විය නොහැක. බොහෝ අපේක්ෂකයින්, ගණනය කිරීමේ කොටස් සඳහාද න්‍යායත්මක විස්තර කිරීමේ කොටස් සඳහාද අඩු ලකුනු ප්‍රමාණයක් රැස්කරගෙන තිබුනි. බොහෝ අපේක්ෂකයින් පෙර සූදානමක්, පසුගිය ප්‍රශ්න පත්‍රවල හුරුවක් හා හොඳාකාරව පාඩම් නොකර ඇති බවක් දක්නට ලැබුනි. නමුත් එසේ කර ඇති අපේක්ෂකයින් කිහිප දෙනෙක් ඉතා වැඩි ලකුනු ප්‍රමාණයක් ලබා ගැනිමද දක්නට ලැබුනි.

### ප්‍රශ්න අංක 01 (ලකුණු 16)

මෙම ප්‍රශ්නය මගින් පිරිවැය/ආදායම්/ලාභ මධ්‍යස්ථ හඳුනා ගැනීමේ න්‍යායත්මක දැනුමද ආර්ථික ඇණවුම් ප්‍රමානය ගණනය කිරිම සහ ආන්තික පිරිවැය ක්‍රමයට අදාලව ආදායම් ප්‍රකාශයක් පිළියෙල කිරිමද පරීක්ෂා කරන ලදි.

**පිළිතුරු සැපයීම**

මෙම ප්‍රශ්නය සඳහා සමස්ථ පිලිතුරු සැපයීම ගැන සෑහීමකට පත්විය නොහැක. A කොටසට පිළිතුරු සැපයීම ගැනද සෑහීමකට පත්විය නොහැක. එකලස් කිරීමේ දෙපාර්තමේන්තුව හා නිම කිරීමේ දෙපාර්තමේන්තුව පිරිවැය මධ්‍යස්ථාන වේ. විකුණුම් මිල වෙළඳපොළ තොරතුරු මත රඳා පැවතෙන හෙයින් විකුණුම් දෙපාර්තමේන්තුව ආදායම් මධ්‍යස්ථානයකි. තවද විකුණුම් දෙපාර්තමේන්තුව භාණ්ඩ විකිනීමෙන් ආදායම් උපයා ගැනීම නිසා එය ආදායම් මධ්‍යස්ථානයකි.

B කොටසේදි ඉතා සුළු පිරිසක් ටයර් සඳහා ආර්ථික ඇණවුම් ප්‍රමාණය නිවැරදිව ගණනය කරන ලදි. අනෙකුත් අපේක්ෂකයින් ටයර් ඉල්ලුම හඳුනා නොගෙන, ආර්ථික ඇනවුම් ප්‍රමාණ ආකෘතියට ඉලක්කම් ආදේශ කරන ලදි. 5 න් ගුණ කර ටයර් ඉල්ලුම සෙවිම වෙනුවට අපේක්ෂකයින් විසින් වාහන ඉල්ලුම ගණනයට ගෙන තිබුනි. තවද ඔවුන් විසින් ඇණවුමකට අදාල පිරිවැය ගණනය කිරීමේදි ප්‍රවාහන පිරිවැය ඇතුලත් නොකොට තිබුනි.

පොදු වැරදි

- නිවැරදි ටයර් ඉල්ලුම හඳුනාගෙන නොතිබීම.
- ආර්ථික ඇණවුම් ප්‍රමාණය සෙවීමේදී අදාල වන සුදුසු වියදම් අයිතමයන් හඳුනාගෙන නොතිබීම.

C කොටස සඳහා ද පිළිතුරු සැපයීම ඉතා දුර්වලය. වැරදි පහත දැක්වේ.

- බොහෝ අපේක්ෂකයින් විසින් ආරම්භක/අවසාන තොග සැලකිල්ලට නොගෙන ආදායම් ප්‍රකාශය පිළියෙල කරන ලදි.
- විකුණුම් කොමිස්, විකුනුම් වටිනාකමින් අඩුකර ගෙන තිබුනි. විකුණුම් කොමිස් විචල්‍ය පිරිවැයකි. එම නිසා එය විචල්‍ය පිරිවැය යටතේ පෙන්නුම් කල යුතුය.
- සත්‍ය ස්ථාවර පිරිවැය වෙනුවට අයවැය ගත පිරිවැය ගණනයට ගැනීම.

පරීක්ෂක යෝජනා

පසුගිය ප්‍රශ්න පත්‍ර පුහුණුව.

## ප්‍රශ්න අංක 02 (ලකුණු 17)

මෙම ප්‍රශ්නය මගින් ශුන්‍යපාද අයවැයකරනයෙහි අවාසි හා නිෂ්පාදන, අමු ද්‍රව්‍ය හා ශ්‍රම සඳහා වූ අයවැය පිළියෙල කිරීම පරීක්ෂා කරන ලදි.

A කොටස සඳහා පිළිතුරු සැපයීම - බහුතරයක්, A කොටස සඳහා පිළිතුරු සපයා තිබුනේ නැත. සමහරක් පිළිතුරු සපයා තිබුනත් ඒවා ඉතා අවිනිශ්චිත පිළිතුරු වන නිසා සෑහිමකට පත්විය නොහැක.

B කොටස සඳහා පිළිතුරු සැපයීම - B කොටස සඳහා පිළිතුරු සැපයීම, A කොටසට වඩා සතුටුදායකය. කෙසේ වෙතත් අපේක්ෂකයින්, වසරේ නිශ්පාදනය සෙවීමේදී ආරම්භක / අවසාන තොග ගැලපීම කර තිබුනේ නැත. තවද ඔවුන්, ලබාගත හැකි ශ්‍රමය හා අවශ්‍ය වන අතිකාල පැය ද හඳුනාගෙන නොතිබුනි.

පොදු වැරදි

- වසරේ නිශ්පාදනය සෙවීමේදී ආරම්භක තොග අඩු නොකිරීම.
- වසරේ නිශ්පාදනය සෙවීමේදී අවසාන තොග එකතු නොකිරීම.
- අතිකාල පැය ගනන හඳුනා නොගැනීම.

පරීක්ෂක යෝජනා

- ප්‍රශ්නය හොඳින් කියවීම
- මේ හා සමාන ප්‍රශ්න වල පුහුණුව

## ප්‍රශ්න අංක 03 (ලකුණු 12)

මෙම ප්‍රශ්නයේදී සරල විචලනයන් ගණනය කිරීම පරීක්ෂා කරන ලදි.

**පිළිතුරු සැපයීම -** මේ හා සමාන ප්‍රශ්න පසුගිය ප්‍රශ්න පත්‍රවලද පරීක්ෂාකර තිබූ නමුදු අපේක්ෂකයින්ගේ පිළිතුරු සැපයීමේ දුර්වලතාවය මෙම ප්‍රශ්නයේදීත් පෙන්නුම් විය. බහුතරයක් මෙම ප්‍රශ්නයට ඉතා අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්හ.

විකුණුම් මිල විචලනය ගණනය කිරීමේදී සත්‍ය විකුණුම් ප්‍රමාණය පෙන්වා නොතිබුනි. විකුණුම් පරිමා විචලනය ගණනය කිරීමේදී සත්‍ය මිල සැලකිල්ලට ගැනීම වැරදිය. සෘජු ද්‍රව්‍ය භාවිත විචලනය ගණනය කිරීමේදී සත්‍ය නිෂ්පාදනය මත වූ ප්‍රමිති භාවිතය වැරදි ලෙස ගණනය කර තිබුනි. තවද සෘජු ශ්‍රම කාර්යක්ෂමතා විචලනය ගණනය කිරීමේදීද එම වැරැද්දම කර තිබුනි.

**<u>පොදු වැරදි</u>**

- සෘජු ද්‍රව්‍ය මිල හා භාවිත විචලනයන් ලෙස, විචලනයන් ගනනය කර තිබුනද ඒවායේ නම් ලියා නොතිබීම.
- විකුණුම් මිල විචලනය වෙනුවට විකුණුම් මිල ආන්තිකය ගණනය කිරීම.
- මිල විචලනය හා භාවිත විචලන සුත්‍ර වල ව්‍යාකුල තත්වයක් පෙන්වීම.
- විචලනයන්හි වාසි (F) හෝ අවාසි (A) තත්වයන් දැක්වීමට අමතක වීම.

<u>පරීක්ෂක යෝජනා</u>

- පසුගිය ප්‍රශ්න පත්‍රවල පුහුනුව.
- විචලනයන්හි අවාසි හෝ වාසි තත්වයන් දැක්විය යුතුයි.
- සූත්‍ර නිවැරදිව යෙදවීම.
- ප්‍රශ්නය හොඳින් කියවූ පසු පිලිතුරු දිමට උත්සාහ කිරිම.

## ප්‍රශ්න අංක 04 (ලකුණු 15)

මෙම ප්‍රශ්නයෙන් පෙරසැරි පිරිවැයකරණය පිලිබඳ දැනුම පරික්ෂා කර ඇත. පිරිවැය ඇගයීම ප්‍රකාශය ගණනය කිරිම හා ඒ අනුව පෙරසැරි ගිනුම් පිලියෙල කිරිම අපේක්ෂකයින්ගෙන් ඉල්ලා ඇත. තවද මෙම ප්‍රශ්නය මගින් අතුරු නිශ්පාදනය, සාමාන්‍ය අපතය හා අසාමාන්‍ය ලාභය පිලිබඳ දැනුමද පරීක්ෂා කරන ලදි.

**පිලිතුරු සැපයීම -** ඉතා සුලු පිරිසක් පමණක් මුලු ළකුණු ප්‍රමාණයම ලබාගෙන තිබුනි. අතුරු නිශ්පාදනය හා අසාමාන්‍ය ලාභය ගනනයට හැර, බහුතරයක් මෙම ප්‍රශ්නයේ ඉතිරි කොටස් සඳහා ලකුනු රැස්කරගෙන තිබුනි. ඔවුන් විසින් නිමි භාන්ඩ, නොනිමි භාන්ඩ සඳහා වූ ඒකක ගණන ගණනය කර ඒවාට අදාල යෙදවුම් හා නිමැවුම් ඒකක සඳහා යොදවා පෙරසැරි ගිනුම් නිවැරදිව පිලියෙල කර තිබුනත් අතුරු නිෂ්පාදනය හා අසාමාන්‍ය ලාභයට අදාල ගැලපිම් නොකර තිබුනි. විශේෂයෙන් නිමි භාන්ඩ හා අවසාන නොනිමි භාන්ඩ ගැන අපේක්ෂකයන්ගේ දැනුම මට්ටම් ඉතා හොඳින් තිබුනි.

**හේතු -** ඉතා සුලු පිරිසක් පමනක් නිවැරදිව අසාමාන්‍ය ලාභය ගණනය කර තිබුනි. නමුත් ඔවුන් විසින් සමානුපාතික ඒකක ගණනය කිරීමේදී අසාමාන්‍ය ලාභය අඩුකර තිබුනේ නැත. සමහර අපේක්ෂකයින් සාමාන්‍ය අපතයේ සුන්බුන් වටිනාකම සහ අතුරු නෂ්පාදනයේ විකුණුම් වටිනාකම, පිරිවැය ගණනය කිරීමේදී අඩු නොකර තිබුනි. නිමි භාන්ඩ වල පිරිවැය, අවසාන නොනිමි වැඩ හා අසාමාන්‍ය ලාභය නිවැරදිව ගණනය කලද, ඒවා පෙරසැරි ගිනුමේ නිවැරදිව පෙන්වා නොතිබුනි.

<u>පරීක්ෂක යෝජනා</u>

- ප්‍රශ්නය හොඳින් කියවූ පසු පිලිතුරු දිමට උත්සාහ කිරිම.
- පසුගිය ප්‍රශ්න වල පුහුණුව.
- පැහැදිලිව අත් අකුරු ලිවීමට පුහුනු විය යුතුය.

## ප්‍රශ්න අංක 05 (ලකුණු 15)

මෙම ප්‍රශ්නය මගින් සමච්ඡේද ලක්‍ෂය ආශ්‍රිත ප්‍රශ්න සහ සීමාකාරී සාධක අවස්ථා වලදී තීරණ ගැනීම පරීක්‍ෂා කරන ලදි.

පිලිතුරු සැපයීම - A කොටසේ (a), (b), (c) හා B කොටසේ ප්‍රශ්න සඳහා පිලිතුරු සැපයීම ඉතා දුර්වලය. ස්වල්ප දෙනකුට පමනක් මෙම ප්‍රශ්නයේදී සම්පූර්ණ ලකුණු ප්‍රමාණයම ලැබී තිබුනි.

A කොටස අපේක්‍ෂකයින් විසින් හොඳින් කියවා නොතිබුනි. ඔවුන් විසින් (a) (b) හා (c) සඳහා ගනනය කිරීම ඒකක වලින් පමනක් පෙන්වා දී තිබුනි. (a) (b) හා (c) සඳහා වූ වටිනාකම් ගණනය කර පෙන්වා නොතිබුනි.

B කොටසට අයත් ප්‍රශ්න 03 සඳහා අදාල වන සීමාකාරී සාධකය නිවැරදිව හඳුනාගෙන නොතිබුනි. බෙහෝ අපේක්‍ෂකයින් B කොටසේ (a) සඳහා වූ ඉල්ලුම සීමාකාරී සාධකයක් වූ අවස්ථාවට අදාල වූ ශ්‍රේණිගත කිරීම නොදැන සිටි අතර ඒ වෙනුවට වැරදි ලෙස ඒකක දායකය, ඉල්ලුමෙන් බෙදා පෙන්වා දී තිබුනි.

B කොටසේ (b) හා (c) සඳහා සමහරක් අපේක්‍ෂකයන් ඒකකයට අදාල භාවිතය වෙනුවට ඒකකයට අදාල වටිනාකම, සීමාකාරී සාධකයක් ලෙස ගෙන තිබුනි.

**<u>පොදු වැරදි</u>**

ඉලක්කම් පෙන්වීමේදි ගණිතමය දෝෂ කර තිබුනි.

**<u>පරීක්‍ෂක යෝජනා</u>**

- පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර භාවිතය.
- පෙර වැඩ ඉදිරිපත් කිරීම.
- පැහැදිලි අත් අකුරු ලවීම.

# B කොටස

වයාපාර මූල්‍ය (ලකුනු 25)

## ප්‍රශ්න අංක 06 (ලකුණු 8)

මෙම ප්‍රශ්නයේදි සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන පිරිවැය, වරණිය කොටස් ප්‍රාග්ධන පිරිවැය, ණයකර ප්‍රාග්ධන පිරිවැය හා වෙලඳපොල අගය මත බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය ගණනය කිරීම පරීක්‍ෂා කර ලකුනු 8 ක් ද වෙන්කර තිබුනි.

පිලිතුරු සැපයීම - අපේක්‍ෂකයින්ගේ පිලිතුරු සැපයීම පෙර වර්ෂ වලට වඩා ඉතා අඩුය. මෙම ප්‍රශ්නය ඉතා සරල වන අතර අවශ්‍ය වනුයේ සමීකරණයට අගයයන් ආදේශ කිරීම පමණි. නමුත් අපේක්‍ෂකයින්ගේ පිලිතුරු සැපයීම ගැන සෑහිමකට පතවිය නොහැක.

අපේක්‍ෂකයින්ගේ ඉතා සුලු කොටසක් නිවැරදිව සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන පිරිවැය ගනනය කර හොඳින් පිළිතුරු සපයා තිබුනි. අනෙකුත් අපේක්‍ෂකයින් නිවැරදිව සූත්‍රය ලියා, නිවැරදිව වටිනාකම් ආදේශ කර තිබුනද, සූත්‍රය විසඳීමේදි ගණිත දූර්වලතා වලට මුහුණ දී තිබුණි. වරණිය කොටස් ප්‍රාග්ධන පිරිවැය ගනනය නිවැරදිව කිරීමට සියලුම අපේක්‍ෂකයින්ට හැකි විය. නමුත් ණයකර පිරිවැය ගණනය කිරීමේදි, අභ්‍යන්තර ඵලදා අනුපාතික ක්‍රමයට ගනනය කිරීම වෙනුවට සමහරක් අපේක්‍ෂකයින් වැරදි ලෙස ලාභාංශ වර්ධන ක්‍රමය අනුව ගණනය කර තිබුනි. තවද ඔවුන් විසින් මෙම ප්‍රශ්නය නිවැරදිව කියවා නොතිබූ අතර, ණයකර පිරිවැය ගණනය කර තිබුනේ නිදහස් කල නොහැකි ණයකර ක්‍රමයටය. මෙම ප්‍රශ්නයේදි ණයකර නිදහස් කල හැකි බව පෙන්වා දී තිබූ අතර, එම නිසා ණයකර පිරිවැය ගණනය කිරීමේදි අභ්‍යන්තර ඵලදා අනුපාතිකය භාවිත කල යුතු වේ.

කෙසේ වෙතත්, අභ්‍යන්තර ඵලදා අනුපාතිකයට අනුව ගණනය කිරීමේදී අපේක්ෂකයින් පහත සඳහන් දෑ නිවැරදිව හඳුනාගෙන නොතිබුනි.

(1) සම මිලට වාර්ෂික පොලී ආදායම.

(2) "0" වන වර්ෂයේ ණයකර වල වර්තමාන වටිනාකම.

(3) 5 වන වර්ෂයේ නිදහස් කර හැකි ණයකර වටිනාකම.

(4) අභ්‍යන්තර ඵලදා අනුපාතිකය හා එම සූත්‍රයට අනුව අගයන් ආදේශ කිරීම.

**පොදු වැරදි :-**

- ස්කන්ධ ප්‍රාග්ධන පිරිවැය සූත්‍රයේ අදාල ස්ථානයේ නිවැරදිව + සලකුනු තැබීමට අමතක වීම.
- ලාභාංශ වර්ධනය %, සූත්‍රයට නොයෙදීම.
- සූත්‍රය නිවැරදිව ලියා තිබුනද එය නිවැරදිව විසඳා නොතිබීම (ගණිත දුර්වලතා).
- නිදහස් කල හැකි ණයකර සඳහා වූ 12% බැගින් වූ පොලිය නාමික අගය වන රු.100/- මත ගනනය නොකිරීම.
- බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය වෙළඳපොල අගය මත පදනම් නොකිරීම.
- අපේක්ෂකයින් බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැයට සඳහා වූ සූත්‍රය දැන සිටියද එය නිවැරදිව විසඳීමට නොදැන සිටීම (ගණිතමය දෝෂ)

**පරීක්ෂක යෝජනා :-**

- පසුගිය ප්‍රශ්න පත්‍රවල පුහුණුව - මෙම ප්‍රශ්නය හා සමාන ප්‍රශ්න නැවත නැවතත් සෑම විභාගයකදී පරීක්ෂාකර ඇත. එම නිසා පෙර ප්‍රශ්න පත්‍ර පුහුනු විය යුතුය.
- ස්කන්ධ පිරිවැය - නිදහස් කල හැකි ණය පිරිවැය, බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය සඳහා වූ සූත්‍ර නිවැරදිව දැනගත යුතු වේ.
- අභ්‍යන්තර ඵලදා අනුපාතය ගනනය කිරීමේදී + / - සලකුනු නිවැරදිව භාවිත කිරීම.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති වට්ටම් / සාධක භාවිත කිරීම.

## ප්‍රශ්න අංක 07 (ලකුණු 14)

මෙම ප්‍රශ්නය කොටස් 3 කින් සමන්විත වේ.

(a) කොටස මගින් ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය ගනනය කිරීම හා එහි සීමාවන් පරීක්ෂා කරන ලදී.

(b) කොටස මගින් ශුද්ධ වර්ථමාන අගය හා අභ්‍යන්තර ඵලදා අනුපාතය ගනනය කිරීම හා නව නිශ්පාදිතය නිර්දේශ කිරීම පරීක්ෂා කරන ලදී.

(c) කොටස මගින් ශුද්ධ වර්තමාන අගය හා අභ්‍යන්තර ඵලදා අනුපාතිකයේ වාසි සඳහන් කිරීම පරීක්ෂා කරන ලදී.

**පිලිතුරු සැපයීම** - සමස්ථ පිලිතුරු සැපයීම ඉතා දුර්වලය.

(a) කොටසට පිළිතුරු සැපයීම - බහුතරයකට (a) කොටස සඳහා ලකුනු රැස්කර ගැනීමට නොහැකි විනි. මෙයට ප්‍රධාන හේතුව වනුයේ ඔවුන් විසින් මෙම කොටසට පිළිතුරු සැපයීමට උත්සාහ නොකිරීම නිසාය. මෙම කොටසට පිළිතුරු සැපයීමට උත්සාහ කල අයදුම්කරුවන් ගිනුම්කරන ප්‍රතිලාභ අනුපාතය සෙවීමේදී අවශ්‍ය වන ආයෝජනයේ සාමාන්‍ය අගය, ගනනය කිරීමට නොදැන සිටියෝය. තවද සමහර අයදම්කරුවන් විසින් මුලික ආයෝජනය වන රුපියල් මිලියන 150, සාමාන්‍ය ආයෝජනය ලෙස ගණනය කර තිබුණි.

(b) කොටසට පිළිතුරු සැපයීම - මෙහිදී ද, ක්ෂය මුදල් ප්‍රවාහයට ඇතුලත් කිරීම, 5 වන අවුරුද්දේ සුන්බුන් අගය නොගැනීම, වැරදි ලකුණු (+,-) හා මුදල් ගලා යෑම් සඳහා විස්තරාත්මක පෙර වැඩ නොපෙන්වීම ආදින් සඳහා සමහරක් අපේක්ෂකයින් හැර අනෙකුත් අපේක්ෂකයින්ට සෑහෙන ලකුනු ප්‍රමාණයක් ලබාගැනීමට නොහැකි විනි.

(c) කොටසට පිළිතුරු සැපයීම - ඉතා සරල පිළිතුරු ලබාදීම නිසා මෙම කොටසට ඉතා අඩු ලකුනු ප්‍රමානයක් ලබාගෙන තිබුනි.

<u>පොදු වැරදි මෙසේය</u>

- ව්‍යාපෘති ඇගයීමකදී මූලික ආයෝජනයට හා සුන්බුන් අගයට වැරදි සලකුනු (+,-) යොදා තිබීම.
- සමහරක් අපේක්ෂකයින් අගයන් ලැබුනු අයුරු (පෙර වැඩ) පෙන්වා නොතිබීම.
- ක්ෂය මුදල් ගලා යෑමක් සේ ගැනීම.
- අභ්‍යන්තර ඵලදා අනුපාතය ගණනය කිරීමට හුරුවී නොතිබීම.

<u>පරීක්ෂක යෝජනා</u>

- ව්‍යාපෘති ගණනය කිරීමේදී මුදල් ගලා යෑම හා ගලා ඒම වල සලකුණු නිවැරදිව පෙන්වීමට පරීක්ෂාකාරී වීම (වියදම් වරහන් තුලද, ආදායම් වරහන් රහිතවද පෙන්වීම)
- සෑමවිට ඔබගේ පෙර වැඩ පෙන්වීම.
- පසුගිය ප්‍රශ්න පත්‍රවල පුහුනුව.

\- - -

**<u>මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු ලබාගැනීම සඳහා හෝඩුවාවන්.</u>**

- ප්‍රශ්නය හා අවශ්‍ය දේ ගැන සැලකිලිමත්ව කියවීම.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සැපයීමේදී අලුත් පිටුවකින් පටන් ගැනීම.
- න්‍යායාත්මක කොටස සඳහා හොඳින් පිළිතුරු සැපයීම. සෑම න්‍යායාත්මක කොටසක් සඳහා ලකුනු පහසුවෙන් ලබාගත හැකි වේ.
- සෑම විටම පෙර වැඩ/කරුනු පෙන්වා එම සංඛ්‍යා ලබාගත් ආකාරය පෙන්වන්න. උදාහරණ - ප්‍රශ්න අංක 7 හි ව්‍යාපෘති ඇගැයීම.
- පසුගිය ප්‍රශ්න පත්‍ර පුහුණුව.

\- * * * -